# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 1721/29 - 2011 සැප්තැම්බර් 03 වැනි සෙනසුරාදා - 2011.09.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ වවුනියාව නගර සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

පක්ෂ සාමාජිකත්වය අහෝසිවීම හේතුකොටගෙන වවුනියාව නගර සභාවේ සභිකයෙකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

එස්. එන්. ජී. නාදන් නම් වූ සභිකයා අයත්වන ඉලංකෙයි තමිල් අරසු කච්චි නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ වවුනියාව නගර සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට ඉහත කී ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නිශ්චිත කාල පරිච්ඡේදය ඇතුළත නාම යෝජනා නොකරනු ලැබ ඇති හෙයින් ද ;

වවුනියාව නගර සභාවේ තේරීම්භාර නිලධාරි සංගරපිල්ලයි සුදාකරන් වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, 2009 අගෝස්තු මස 08 වැනි දින වවුනියාව නගර සභාව සඳහා පැවැත්වූ ඡන්ද විමසීමේ දී තෝරා පත් කර ගත් අවසාන සභිකයා ළඟට වැඩිම මනාප සංඛ්‍යාව ලබා ගත් පොන්නයියා සෙල්ලත්තුරෙයි මහතා ඒ පුරප්පාඩුව ඇති වූ වවුනියාව නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. සුදාකරන්,<br>
තේරීම්භාර නිලධාරි,<br>
වවුනියාව නගර සභාව.

2011 අගොස්තු මස 19 වැනි දින,<br>
මැතිවරණ කාර්යාලය,<br>
වවුනියාව.

09 - 586